# පොලිස්පති නිල කාර්යාලය

**RTM-924** **CRTM-762** 2024. 10.30

පොලිස්පති ගෙන්,

සියලුම : ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වරුන්
: නියෝජ්‍ය පොලිස්පති වරුන්
: අණදෙන නිලධාරීන්
: කොට්ඨාස භාර නිලධාරීන් / අධ්‍යක්ෂ වරුන්
: දිස්ත්‍රික් භාර ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිවේදිත නිලධාරීන්
: මූ.පො.ප /ස්ථානාධිපති වරුන්

**<u>පොලිස් නිලධරයන්ගේ ක්‍රියාකාරකම් මහජනතාව විසින් වීඩියෝගත කිරීම සම්බන්ධ ව.</u>**

පොලිස් නිලධරයන් විසින් සිදු කරන රාජකාරි මෙන්ම නිලධරයන්ගේ ක්‍රියාකාරකම් ද, මහජනතාව විසින් වීඩියෝගත කරන අවස්ථා වර්තමානයේ බහුල ව නිරීක්ෂණය වේ.

මෙලෙස වීඩියෝගත කරන අවස්ථාවලදී ඇතැම් පොලිස් නිලධරයන් එම පුද්ගලයන්ට දෝෂාරෝපණය කිරීම්, වීඩියෝගත කරන ජංගම දුරකථන ආදිය පොලිස් භාරයට ගැනීම් සහ ඇතැම් අවස්ථාවලදී එලෙස වීඩියෝගත කරන පුද්ගලයන් අත්අඩංගුවට ගැනීම් පවා සිදු කර ඇති බවට වාර්තා වී ඇත.

ඇතැම් පොලිස් නිලධරයන් ඉහත පරිදි ක්‍රියා කරන අවස්ථා බොහොමයක දී, එම නිලධරයන්ගේ නීති විරෝධී, විනය විරෝධී හෝ සදාචාර විරෝධී ක්‍රියාවන් එකී පුද්ගලයන් විසින් වීඩියෝගත කර ඇති බව වැඩිදුරටත් නිරීක්ෂණයට ලක් වී ඇත.

මෙලෙස මහජනතාව විසින් පොලිස් නිලධරයන්ගේ රාජකාරි හෝ වෙනත් ක්‍රියාකාරකම් හෝ වීඩියෝගත කිරීම කිසිදු නීතියකින් වළක්වා නොමැති බව මූලික ව ඔබ යටතේ සිටින නිලධරයන් වෙත දැනුම් දිය යුතු ය.

තවද, යම් වරදක් වීඩියෝගත කරන ලද අවස්ථාවක දී එම සංස්කරණය නොකල වීඩියෝ රෙකෝඩනය (ශ්‍රව්‍ය දෘශ්‍ය රෙකෝඩනය) සාක්ෂි වශයෙන් ඉදිරිපත් කිරීම සඳහා නෛතික ප්‍රතිපාදන 1995 අංක 14 දරන සාක්ෂි (විශේෂ විධිවිධාන) පනතෙහි 4 වන වගන්තියට ඇතුලත් ව ඇති අතර, එම නෛතික ප්‍රතිපාදන අපරාධ හෝ සිවිල් නඩුවක පැමිණිලි පාර්ශවය මෙන්ම විත්ති පාර්ශවය විසින් ද ප්‍රයෝජනයට ගත හැකි ය.

අංක 140, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ -02 ශ්‍රී ලංකාව
දු.ක. 2421750, 2421111 - දිගුව : 3000 ෆැක්ස් : 2446174 ඊ-මේල්: igp@police.lk

එමෙන්ම, පොලිස් නිලධරයෙකු සිදු කරන විනය විරෝධී හෝ සදාචාර විරෝධී ක්‍රියාවන් මහජනතාව විසින් වීඩියෝගත කිරීම මඟින් එම පොලිස් නිලධරයන් සම්බන්ධයෙන් විනයානුකූලව ක්‍රියා කිරීමට හැකියාව ලැබෙන අතර, එවැනි විනය විරෝධී හෝ සදාචාර විරෝධී ක්‍රියාකාරකම් නිවැරදි කර ගැනීමට ද එය අවස්ථාවක් වනු ඇත.

එබැවින්, පොලිස් නිලධරයන්ගේ රාජකාරි හෝ වෙනත් ක්‍රියාකාරකම් මහජනතාව විසින් වීඩියෝගත කිරීම වැළැක්වීමට පියවර නොගත යුතු බවට ඔබ යටතේ සිටින සෑම නිලධරයෙකුම දැනුවත් කිරීමට ක්‍රියා කළ යුතු බවට දන්වා සිටිමි.

කරුණු එසේ වුවද, පොලිස් නිලධරයන්ගේ රාජකාරි හෝ වෙනත් ක්‍රියාකාරකම් වීඩියෝගත කිරීමෙන් අනතුරුව එම වීඩියෝපට සංස්කරණය කර, ශ්‍රී ලංකා පොලිසිය කෙරෙහි මහජනතාව වෙත වෛරී හැඟීම් ඇති වන ආකාරයෙන් එම සංස්කරණය කරන ලද වීඩියෝ දර්ශන සමාජ මාධ්‍ය ජාලා වෙත මුදා හැරීමක් සිදු වුවහොත්, එවැනි තැනැත්තන් විෂයෙහි නෛතික පියවර ගැනීමට මෙම උපදෙස් පණිවිඩය මඟින් බාධාවක් නොවන බව ද වැඩිදුරටත් දන්වා සිටිමි.

ප්‍රියන්ත වීරසූරිය
වැඩ බලන පොලිස්පති

නීතිඥ ප්‍රියන්ත වීරසූරිය
වැඩබලන පොලිස්පති
පොලිස් මූලස්ථානය
කොළඹ - 02

පිටපත - ගොනුවට
12962